# 24 වන සම්පත සුරකිමු

වනය සුන්දර තැනකි. එය සිවුපාවුන්, පක්ෂීන් උරගයන් හා නොයෙක් ගස්වැල්වලින් ද සමන්විත ය. ගලා හැලෙන දිය දහරාවලින් එය තවත් සුන්දර වෙයි. ඒ නිසා වනය කාගේත් සිත් දිනා ගනී. අඹ, දඹ, වෙරළු, ආදිය පමණක් නොව, මාදං, හිඹුටු වැනි බොහෝ පලතුරු වර්ග එහි ඇත. අත්තෙන් අත්තට පනින වඳුරන්ගෙන් වනය ඝෝෂාකාරී වෙයි. වනය පුරා අතරින් පතර ඇති අඩි පාරවල්, ඒවායේ සතුන් මෙන් ම මිනිසුන් ද ගමන් කරන බවට සලකුණු වේ. වනයේ අසිරිය මෙන් ම ඉන් ලැබෙන ප්‍රතිඵල ද අති විශාල ය. අපගේ දිවි පැවැත්මට අවශ්‍ය ජල සම්පත ලබා දෙන්නේ ද වනයයි. එසේ ම වනය, අපට ජීවත් වීමට උපකාරී වන වායුව පිරිසිදු කර දෙයි. වර්ෂාව ලබා දීමට උපකාරී වන්නේ ද වනයයි.



ලංකාවේ වනාන්තරවල දරුණු සිව්පාවුන් දක්නට නැත. ඉඳහිට හමුවන දිවියා, වලහා වැනි සත්තු වනාන්තරවල ජීවත් වෙති. සිංහයා ලංකාවේ වනාන්තරවල දක්නට නොලැබේ. සද්දන්තයා හෙවත් අලියා වියළි කලාපීය වනාන්තරවල දක්නට ලැබේ. සිංහරාජය අපේ විශාල ම තෙත් වනාන්තරයයි. මෙම වනාන්තර අපි අපේ ජීවිතය මෙන් රැක ගනිමු.



## ක්‍රියාකාරකම : 1

පහත දී ඇති වාක්‍ය සුදුසු පරිදි අනුපිළිවෙළට ගළපා ලියන්න.

i. ✸ ගස් නිසා අපට ජල සම්පත ද ලැබේ.
✸ අපි මේ වනාන්තර රැක ගනිමු.
✸ මේ ජලය නිසා ඇළ, දොළ, ගංගා ඇති වේ.
✸ සිංහරාජ වනය අපේ රටේ විශාල ම වනයයි.
✸ එහි විවිධ වර්ගයේ ගස් දක්නට ඇත.

ii. ✸ දවසක් හේනට යනකොට හේනට අලි ඇවිත්
✸ ඒ ගමරාල හේන් ගොවිතැන් කළා.
✸ ඊට පස්සෙ හයියෙන් කෑ ගහලා අලි එළවලා දැම්මා.
✸ එක ගමක ගමරාල කෙනෙක් හිටියා.
✸ ඔහු දුවගෙන ගිහින් ලොකු ගහකට ගොඩ වුණා.

## ක්‍රියාකාරකම : 2

පහත දැක්වෙන කොටස කියවන්න.

| |
|---|
| **වනය සුන්දර තැනකි ඒ නිසා වනය කාගෙත් සිත් ගනී අඹ දඹ වෙරළු ආදිය පමණක් නොව මාදං හිඹුටු වැනි බොහෝ පලතුරු වර්ග එහි ඇත.** |

ඉහත කොටසෙහි අදහස වටහා ගැනීම අපහසු ය. ඊට හේතුව අදාළ තැන්වල විරාම ලක්ෂණ යොද නොතිබීමයි.

එම කොටස නැවත කියවන්න.

| |
|---|
| **"වනය සුන්දර තැනකි. ඒ නිසා වනය කාගේත් සිත් ගනී. අඹ, දඹ, වෙරළු ආදිය පමණක් නොව, මාදං, හිඹුටු වැනි බොහෝ පලතුරු වර්ග එහි ඇත.** |

විරාම ලක්ෂණ යෙදුණු පසු එහි අරුත මැනවින් වැටහේ. කියවීමේ පහසුව ද එයින් ඇති වේ. ඒ නිසා ලිවීමේ දී විරාම ලකුණු යෙදීමට අපි හුරු වෙමු.

| |
|---|
| • මෙම ලකුණ තිත ලෙස හැඳින්වේ. |

* වාක්‍යයක් අවසාන බව දැක්වීමට තිත යොදනු ලැබේ.

උදා : වනය සුන්දර තැනකි.

එහි සත්තු බොහෝ වෙති.

* දිග යෙදුම් කෙටිකර දැක්වීමේ දී තිත යෙදේ.

උදා : පෙරවරු පෙ.ව.

ක්‍රිස්තු වර්ෂ ක්‍රි . ව .

ලංකා ගමනාගමන මණ්ඩලය ලං . ග . ම

* දශම ලියා දැක්වීමේ දී තිත යොදනු ලැබේ.

උදා : 3.5 4.6

| , | මෙම ලකුණ කොමාව වශයෙන් හැඳින්වේ. |
|---|---|

* එකිනෙකට සම්බන්ධ කරුණු වෙන් කිරීමේ දී කොමාව යොදා ගැනේ.

උදා : අඹ, දඹ, වෙරළු ආදිය පමණක් නොව, මාදං, හිඹුටු වැනි බොහෝ පලතුරු වර්ග එහි ඇත.

* ආමන්ත්‍රණය කරන පදය වෙන් කිරීමට ද කොමාව යෙදේ.

උදා : දරුව, මෙහි එන්න.

* මඳක් නැවතී කිවයුතු තැන්වල දී කොමාව යෙදේ.

උදා : අකුණු ගසමින්, ගොරවමින්, සුළං හමමින් මහවැසි වසින්නට විය.

* පූර්ව ක්‍රියාවලට පසු කොමාව යෙදේ.

උදා: මම බසයට නැග, ගමට ගියෙමි.

ලිවීමේ දී මෙම විරාම ලකුණු මෙන් ම වෙනත් විරාම ලකුණු ද යෙදෙන ආකාරය මැනවින් වටහා ගන්න.

## ක්‍රියාකාරකම : 3

සුදුසු තැන්වල තිත යොදා නැවත ලියන්න.

i. "ඔහු සැබැවින් ම දක්ෂයෙක් විය ඔහුට කළ නොහැකි දෙයක් නැත ඒ තරමට ම ශිල්ප උගත්තෙකි එවැන්නන් රටට ආදර්ශයකි ඔබත් එලෙස වීමට සිතට ගන්න"

ii. ඔහු මගේ සමීපතම මිත්‍රයා විය දුකේ දීත් සැපේ දීත් අපි එකට ම සිටියෙමු ඔහු මගෙන් වෙන් වීම මට දරාගත නො හැක්කකි.

iii. මොහොතක් නවතින්න මා දෙස බලන්න මට කියන්න ඔබට වූ දේ? මා ඔබට පිහිට වන්නම්

iv. පෙ ව නවයට පටන් ගත් රැස්වීම ප ව දෙකට අවසන් විය

v. ලං වි ම සඳහා නව ගොඩනැගිල්ලක් වෙන් කර ඇත

## ක්‍රියාකාරකම : 4

සුදුසු තැන්වල කොමාව යොදා නැවත ලියන්න.

i. අවසර දේවයන් වහන්ස මොහු මට බැණ වැදී නින්දා කොට මාගේ වස්තුව පැහැරගෙන මට මහත් අලාභහානි කර පැන ගියේ ය.

ii. මිත්‍රය ඔබේ ජීවිතය ගොඩ නගන්න උත්සාහ ගන්න. ඔබ අධිෂ්ඨානය ඇතිකරගෙන අලස නොවී උද්‍යෝගයෙන් යුතු ව අභියෝග ජයගෙන ඉදිරියට යන්න.

iii. ගංගා ඇළ දොළ දිය ඇලි වැව් අමුණු වනාන්තර පමණක් නොව රට වටා ඇති සයුර නිසා ද ශ්‍රී ලංකාව අලංකාර දිවයිනක් බවට පත් ව ඇත.

iv. අමුත්තෝ ශාලාවට පිවිස අසුන් ගත්හ.

v. අයියා ගසට නැග අඹ කඩා අප සියලුදෙනාට ම දුන්නේ ය.

## ක්‍රියාකාරකම : 5

පහත වාක්‍ය තනි වාක්‍යයක් ලෙස ලිවීමේ දී කොමාව යෙදෙන අයුරු බලන්න.

උදා : ළමයා පොත් කියවයි.
ළමයා පත්තර කියවයි.
ළමයා සඟරා කියවයි.
**ළමයා පොත්, පත්තර හා සඟරා කියවයි.**

පහත දැක්වෙන වාක්‍ය කොමාව යොදා සම්බන්ධ කර ලියන්න.

i. ඔහු නවකතා කියවයි.
ඔහු කෙටිකතා කියවයි.
ඔහු ළමාකතා කියවයි.

ii. අම්මා සාය මසයි.
අම්මා හැට්ට මසයි.
අම්මා ගවුම් මසයි.

iii. නිමල් සීගිරි ගියේ ය.
නිමල් දඹුලු ගියේ ය.
නිමල් නුවර ගියේ ය.

පහත දැක්වෙන වාක්‍ය දී ඇති උදාහරණයට අනුව වෙන්කර ලියන්න.

උදා : ධනපාල බත්, මාළු හා එළවළු කයි.
ධනපාල බත් කයි.
ධනපාල මාළු කයි.
ධනපාල එළවළු කයි.

i. කමලිනී කවි, ගීත හා නාට්‍ය ලියයි.
ii. වනයේ මාදං, හිඹුටු, හා වෙරළු ගස් ඇත.
iii. වනය පක්ෂීන්ගෙන්, ගස්වැල්වලින් හා සිව්පාවුන්ගෙන් අලංකාර වේ.
iv. ලංකාවේ වනාන්තර, ගංගා හා දියඇලි දක්නට ලැබේ.

## ක්‍රියාකාරකම : 6

නිදසුනට අනුව දී ඇති වගන්ති අර්ථවත් ලෙස ගොඩ නගන්න.

උදා : අපට ජීවත් වීමට වායු වර්ග උපකාරී වන වනය පිරිසිදු කර දෙයි.
වනය, අපට ජීවත් වීමට උපකාරී වන වායු වර්ග පිරිසිදු කර දෙයි.

i. ජල සම්පත අවශ්‍ය පරිසරය රැකීමට ලබා දෙන්නේ ද වනයයි.
ii. ලංකාවේ සිව්පාවුන් දරුණු වනාන්තරවල දක්නට නැත.
iii. අලියා සද්දන්තයා වනාන්තරවල හෙවත් වියළි කලාපීය දක්නට ලැබේ.
iv. අපි ජීවිතය මෙන් අපේ වනාන්තර රැක ගනිමු.
v. වඳුරන්ගෙන් අත්තෙන් අත්තට පනින වනාන්තරය ඝෝෂාකාරී වෙයි.

## ක්‍රියාකාරකම : 7

පහත දී ඇති වාක්‍යවල පද වෙන්කර ලියන්න.

i. වනයටපිවිසුණුඅපිමුවෙකුදුටුවෙමු.

ii. අම්මේමමහෙටගෙදරඑන්නෙමි.

iii. අපිඅපේපාසලරැකගනිමු.

iv. අපේරටේවිශාලවනාන්තරදඇත.

## ක්‍රියාකාරකම : 8

පහත දී ඇති මාතෘකා සහ මග පෙන්වීම යටතේ අර්ථවත් වගන්ති කීපයකින් යුත් ඡේදය බැගින් ලියන්න.

i. අපේ ගෙදර
   * පිහිටීම
   * ජීවත්වන අය
   * බඩු මුට්ටු ආදිය

ii. මගේ මල්වත්ත
   * මල්වත්තේ ස්වභාවය
   * එහි ඇති මල්වර්ග
   * ඇති සුන්දර බව

iii. පරිසරය සුරකිමු
   * පරිසරය විස්තර කිරීම
   * පරිසරය අපට වැදගත් වන හැටි
   * එය රැක ගන්නට කළ යුතු දේ